# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2012.08.30

වේලාව : පෙ.ව.09.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. ගරු සභාපති, | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු උපසභාපති | ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම්. රූමි මැතිතුමා |
| 06. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 07.ගරු නාගරික මන්ත්‍රී | ඒ.අසංක තිල්මිණී විජේසිංහ මැතිතුමා |
| 08. ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 09. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජේ.මලීක්ෂා මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. එස්.එච්.අමිතා කරුණාරත්න මහත්මිය | ප්‍රධාන කළමනාකරණ සහකාර |

(01) **ආගම සිහිකිරීම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන :**

ගරු සභාපතිතුමා කථාකරමින්, අද දින පවත්වනු ලබන්නේ 2012 වර්ෂයේ අගෝස්තු මාසයට අදාළ මහා සභා රැස්වීම වන අතර , ඒ සඳහා සහභාගීවීමට පැමිණ සිටින ගරු උපසභාපතිතුමා, ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා සහ පුවත්පත්කලාවේදී මහතා සාදරයෙන් පිළිගන්නා බව පැවසීය.

මග නැගුම ව්‍යාපෘතිය යටතේ මාර්ග සංවර්ධනයට එක්කෝටි විසි ලක්ෂයක මුදලක් ලැබී ඇති බවත්, එම මුදල් යොදවමින්, නගර සභා බලප්‍රදේශය තුළ මාර්ග සකස් කිරීමේ කටයුතු ප්‍රදේශයේ ලියාපදිංචි සමිති වෙත කොන්ත්‍රාත් ලබා දී අදාල කර්මාන්තයන් හි වැඩ කටයුතු ඉටුකරගැනීමට කටයුතු කරන බව පැවසීය. සෑම කර්මාන්තයක්ම අදාල නිලධාරීන් යොදවා විධිමත් පරිදි අධීක්ෂණය කරන අතර, නියමිත ප්‍රමිතියට සකස් නොකරන ලද කර්මාන්ත සඳහා මුදල් නොගෙවන බවත් පැවසීය. ගරු මන්ත්‍රීවරුන් නියෝජනය කරනු ලබන කොට්ඨාශයන්හි සිදුකරන කර්මාන්තයන් ගරු මන්ත්‍රීවරුන් විසින් අධීක්ෂණය කල යුතු බව දන්වමින්,

සභාවේ ඉදිරි වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**(03) 2012.07.26 වන දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම**

2012.07.26 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් යෝජනා කල අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

**(04) පසුගිය වාර්තාව සමාලෝචනය කිරීම**

බළන්ගොඩ නව බස්නැවතුම්පලේ විදුලි ජනක යන්ත්‍රය සවිකර තිබූ කඩ කාමරය පසුගිය සභාවේ දී කුලී පදනම මත බදු ලබා දී තිබෙන බවත්, සභා රැස්වීම කලින් ආරම්භ කල නිසා එම අවස්ථාවේ තමා නොසිටි බැවින් එම සභා තීරණය සම්බන්ධව තමාගේ විරෝධතාව ප්‍රකාශ කරන බව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් දැන්විය.

සභාවේ බහුතර එකඟතාවය මත එම කඩ කාමරය මාසික කුළිය රු.3000/- ක් හා මාස 03 ක කුළිය තැන්පත් කිරීමෙන් අනතුරුව බදු ගිවිසුමක් අත්සන් කර ලබාදීමට කටයුතු කල බව ගරු සභාපතිතුමන් විසින් දැන්විය.

**05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම :**

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගති ගරු මන්ත්‍රීතුමන්ලාගේ දැනගැනීම පිණිස සභාවට ඉදිරිපත් කරන ලදී.

**06. සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම :**

**06:01 බස්නැවතුම්පල ඉඩම පවරාදීම සඳහා මුදල් ගෙවීම :**

උක්ත කරුණට අදාළව ඉදිරිපත්කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

බස්නැවතුම්පල ඉඩම සභාවට පවරාදීම සඳහා රු.මිලියන 40 ක මුදල ගෙවන ලෙස නාගරික සංවර්ධන අධිකාරියෙන් දන්වා එවා තිබූ බවත්, නමුත්, අදාල මුදල නොගෙවා ඉඩම පවරා දෙන ලෙස ඉල්ලීමක් කල බවත්, නමුත් එසේ කල නොහැකි බැවින් අදාල මුදල ගෙවන ලෙස එමගින් දන්වා තිබුණි.

පළාත් පාලන ආයතනවලට මෙතරම් වියදමක් දැරිය නොහැකි බැවින් අදාල මුදල ගෙවීමට නොහැකි බව එම ආයතනය වෙත දන්වා යැවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**06:02 අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ගල් මිළදී ගැනීම :**

මගනැගුම වැඩ සටහන යටතේ මාර්ග 11 ක් සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලැබී ඇති බැවින්, ඒ සඳහා අවශ්‍ය අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ගල් මිළදී ගැනීමට අදාල වර්තමාන මිළ ගණන් පිළිබඳ විස්තරයක් සභාව ඉදිරිපත් කර තිබුණි.

කොන්ත්‍රාත්කරුවන්ට අදාල ගල් මිළදීගෙන කර්මාන්ත සඳහා යොදා ගැනීමට අවසර ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**06:03 බළන්ගොඩ නගර සභාවේ කණිෂ්ඨ සේවක තනතුරක රැකියා අවස්ථාවක් ලබාගැනීම**

ඉහත සඳහන් කරුණට අදාළව කාර්යාල කම්කරු, කේ.ජී.මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මෙම කාර්යාලයේ හෝ කාර්යාලයට අනුයුක්ත නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ හෝ විද්‍යුණුත පියස හෝ කියවීම් ශාලාවේ පවතින කණිෂ්ඨ සේවක තනතුරක් සඳහා තම දියණිය බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු කරදෙන ලෙස ඉල්ලා තිබිණ.

දැනට පුරප්පාඩු නොමැති බැවින් පසුව සලකා බැලීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**06:04 ලේඛනාගාරයේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම :**

ලේඛනාගාරයේ අනවශ්‍ය ලිපිලේඛන රාශියක් ගොඩ ගැසී ඇති බැවින් , කමිටුවක් පත්කර එම කමිටුව හරහා අනවශ්‍ය ලිපි ලේඛන හඳුනා ගෙන ඒවා ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කරදෙන ලෙසත්, ලේඛනාගාරයේ ඉඩකඩ ප්‍රමාණවත් නොවන නිසා ලිපිලේඛන විධිමත් පරිදි අසුරා තබාගැනීමට නොහැකි බැවින් ඉඩකඩ ලබාගැනීම සම්බන්ධව සුදුසු කටයුතු කරදෙන ලෙස ඉල්ලා තිබිණ.

දැනට ඇති කෑම කාමරය ලේඛනාගාරය ලෙස භාවිතා කිරීමටත්, පුස්තකාලයේ පුවත්පත් දමා ඇති කෑම කාමරය කාර්යාලයේ නිලධාරීන්ගේ කෑම කාමරය ලෙස යොදාගැනීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී. ලේඛනාගාරයේ අනවශ්‍ය ලිපිලේඛන ඉවත් කිරීම සඳහා පහත සඳහන් කමිටුව පත්කරන ලදී.

01. ලේකම්
02. ගණකාධිකාරී
03. ප්‍රධාන කළමණාකරන සහකාර
04. වැඩ අධිකාරී
05. මහජන සෞඛ්‍ය පරීක්ෂක
06. ආදායම් පරික්ෂක.

**06:05 සේවයෙන් විශ්‍රාම ලබාගැනීම :**

2012-10-24 වන දින තමා විශ්‍රාම යන බැවින්, එම තනතුරේ පුරප්පාඩුව සඳහා හෝ වෙනත් කම්කරු තනතුරකට සිය පුතණුවන් වන ඩී.එම්.පැතුම් මධුභාෂිත චන්ද්‍රසිරි යන අය බඳවා ගන්නා ලෙස ඉල්ලමින්, ඩී.එම්.චන්ද්‍රසිරි මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.

පුරප්පාඩුව පවතින තනතුර සඳහා බඳවා ගැනීමේ කටයුතු පසුව සලකා බැලීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**06:06 බළන්ගොඩ නගර සභා නිල බ්ලොග් අඩවිය සඳහා අනුමැතිය ලබාගැනීම :**

බළන්ගොඩ නගරසබා නිල බ්ලොග් අඩවිය ශ්‍රී ලංකා පළාත් පාලන ඉතිහාසයේ පළාත් පාලන ආයතනයක් ආරම්භ කල පළමු හා එකම බ්ලොග් අඩවිය වේ. මේ සඳහා විශාල පැසසුම් නන් දෙසින් ලැබී ඇති අතර, 25,000 ආසන්න පිරිසක් මේවන විට මෙයට සම්බන්ධ වී ඇත. මෙය තවදුරටත් පවත්වාගෙන යාම සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා තිබිණ.

මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06:07 **නිල ඇඳුම් ලබාදීම :**

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කර ඇති 2012-08-28 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ආයතන සංග්‍රහයේ xxi පරිච්ඡේදය සහ පාලන අංක 161 හා 1981-12-09 දිනැති චක්‍රලේඛනය සහ 08/2001 චක්‍රලේඛනය සහ 2011-08-22 දිනැති 14/2011 දිනැති චක්‍රලේඛනය පරිදි රාජ්‍ය සේවයේ පළාත් රාජ්‍ය සේවයේ නිල ඇඳුම් හිමි නිලධාරීන් සහ සේවකයන් වෙනුවෙන් වාර්ෂිකව ලබාදිය යුතු නිල ඇඳුම් 2012 වර්ෂය වෙනුවෙන් ලබාදීමට සභාවේ අනුමැතිය ඉල්ලා තිබිණ.

මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06:08 **ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය :**

ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ තෙවන මහා සභා රැස්වීමට සහභාගීවීමට දින නියම වී තිබූ බැවින් (2012.08.25 ) 2012 වර්ෂයේ සාමාජික ගාස්තුව සඳහා රු.10000/- ක මුදල් ගෙවීම සඳහා සභාවේ ආවරණ අනුමැතිය ලබාගැනීමට අදාළව ඉදිරිපත් කර තිබූ 2012-08-30 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ 2012 වසරේ රු.10000/- ක් වූ සාමාජික මුදල් ගෙවීම සඳහා සභාවේ ආවරණ අනුමැතිය ලබාදෙන ලදී. මේ සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගැනීමට තීරණය විය.

07. **මුදල් ගෙවීම් අනුමත කිරීම : ( රු.10000/- ට වැඩි ගෙවීම් )**

රු.10000/- ට වැඩි ගෙවීම් 2012.08.20 වන දින පැවති මුදල් ප්‍රතිපත්ති හා ප්‍රසම්පාදන කමිටු රැස්වීමට ඉදිරිපත් කල බව වාර්තා කර තිබුණි.

එම කමිටු වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

08. **ඇස්තමේන්තු අනුමත කිරීම :**

ඇස්තමේන්තු කිසිවක් ඉදිරිපත් නොවීය.

09. **ටෙන්ඩර් මිළ ගණන් සලකා බැලීම :**

09:01 **H.F.8558 ට්‍රැක්ටරයට ටයර් දෙකක් ලබාගැනීම**

ඉහත සඳහන් අංක දරණ ට්‍රැක්ටරයට ටයර් දෙකක් ලබාගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් සභාවට ඉදිරිපත් කරන ලදී.

| පී.එස්.ටයර් වර්ක්ස් | ජයන්ති ටයර් සෙන්ටර් | සිටි ටයර් සර්විස් |
|---|---|---|
| රු.25400/- | රු.24800/- | රු.26200/- |

ඉහත සඳහන් මිළ ගණන් අතරින් ජයන්ති ටයර් සෙන්ටර් ආයතනයේ අවම මිළ ගණන පිළිගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

09:02 **G.K.1483 ට්‍රැක්ටරයට රිබිල්ට් ටයර් 03 ක් මිළදී ගැනීම :**

මෙම නගර සභාවට අයත් ඉහත අංක දරණ ට්‍රැක්ටරයට රිබිල්ට් ටයර් 03 ක් මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් පහත දැක්වේ.

| පී.එස්.ටයර් වර්ක්ස් | ටයර් සෙන්ටර් | රෙයින්බෝව් ටයර් සර්විස් |
|---|---|---|
| රු.38550/- | රු.38700/- | රු.38850/- |

ඉහත සඳහන් මිළ ගණන් අතුරින් ජයන්ති ටයර් සෙන්ටර් ආයතනයේ අවම මිළ ගණන පිළිගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

09:03 **H.F.7899 JCB යන්ත්‍රය :**

මෙම සභාවට අයත් ඉහත සඳහන් අංක දරණ ජේසීබී යන්ත්‍රයේ හයිඩ්‍රොලික් පොම්පය අලුත්වැඩියා කිරීම සදහා අමතර කොටස් මිළදී ගැනීමට සෙනොක් කම්බයින් ට්‍රේඩ් සෙන්ටර් ආයතනයෙන් මිළ ගණන් කැඳවා ඇත. ඒ අනුව එම අමතර කොටස් මිළදී ගැනීමට රු.225523.20 ක මුදලක් වැයවන බැවින්, එම මුදල ගෙවා අමතර කොටස් මිළදී ගැනීමට සභාවේ අනුමැතිය ඉල්ලා තිබිණ.

අදාල ආයතනයෙන් එම අමතර කොටස් මිළදී ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

10. **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ** : නැත

11. **යෝජනා**

යෝජනා කිසිවක් ඉදිරිපත් නොවිය.

12. **ආදායම් - වියදම් වාර්තා හා අනෙකුත් වාර්තා ඉදිරිපත් කිරීම.**

2012 වර්ෂයේ අප්‍රේල් මාසයට අදාළ ආදායම් හා වියදම් පිළිබඳ වාර්තාව සභාවට ඉදිරිපත් කර තිබුණි.

| | |
|---|---|
| පුනරාවර්ථන ලැබීම් | 7,148,941.59 |
| වෙනත් ලැබීම් | 4,361,334.62 |
| **මුළු ලැබීම්** | **11,510,276.21** |
| පුනරාවර්ථන වියදම් | 3,657,677.65 |
| වෙනත් වියදම් | 2,120,336.65 |
| **මුළු වියදම්** | **5,778,014.04** |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

❖ බළන්ගොඩ නගර සභා කාර්යාලයේ 2012-07-01 සිට 2012-07-31 දක්වා වෙළඳ හා ලාභඅලාභ ගිණුම සභාවට ඉදිරිපත් කරන ලදී.

| විස්තරය | 2012.07.01 සිට 2012.07.31 දක්වා |
|---|---|
| විකුණුම් | 1,069,795.56 |
| **විකුණුම් පිරිවැය** | **635,071.91** |
| දළ ලාභය | 434,723.65 |
| ශුද්ධ ලාභය/අලාභය | 1,069,795.56 |

මෙම ලාභඅලාභ ගිණුම සභාව විසින් අනුමත කරන ලදී.

- 2012.06.01 දින සිට 2012.06.29 දින දක්වා මෙම සභාව සතු වාහන සදහා වැය වී ඇති ඉන්ධන පිළිබඳ වාර්තා සභාවට ඉදිරිපත් කරන ලදී.

- මෙම ඉන්ධන වාර්තා සභාව විසින් අනුමත කරන ලදී.

ගරු සභාපතිතුමාගේ නිල රථය සඳහා ඉන්ධන සීමාව මසකට ලීටර් 500 කර තිබුණ ද මෙම ඉන්ධන වාර්තාව අනුව මසකට ඉන්ධන සීමාව ලීටර් 800 දක්වා වැඩි වී ඇති බැව් ගරු උපසභාපතිතුමා විසින් දැන්විය.

මාස දෙකක එකතුවක් ඉදිරිපත් කර තිබීම නිසා එසේ සිදු වී ඇති බැව් අනාවරණය වූ අතර, ඉදිරියේ දී මාසිකව වැයවන ඉන්ධන ප්‍රමාණය වෙන වෙනම ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස අදාල විෂය භාර නිලධාරී වෙත දැනුම්දීමට සභාව තීරණය කරන ලදී.

## 13. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

2012.08.20 වන දින පැවති තානායම් කමිටුවේ වාර්තාව , 2012.08.20 වන දින පැවති මුදල් ප්‍රතිපත්ති හා ප්‍රසම්පාදන කමිටුවේ වාර්තාව ද 2012-08-24 වන දින පැවති සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමණාකරන කමිටු රැස්වීමේ වාර්තා සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙම වාර්තාවන් සභාව විසින් අනුමත කරන ලදී.

- ලබන මාසයේ පළමු සතියේ කර්මාන්ත කමිටු රැස්වීම ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී

## 14. වෙනත් කරුණු :

### 14:01 ගරු උපසභාපති, ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා

ගරු උපසභාපතිතුමා කථාකරමින්, නගර සභා ක්‍රීඩාපිටිය විවිධ සංදර්ශන/තරඟ ආදිය පැවැත්වීම සඳහා නොමිලයේ ලබාදීම සිදුකරන බවත්, එම කාර්යයන් සඳහා කණු සිටුවීම ආදිය සිදුකරන බවත්, එසේම වාහන ද ඇතුල් කිරීම නිසා ක්‍රීඩාපිටියට හානිසිදුවන බැවින්, නඩත්තු කටයුතු වෙනුවෙන් යම් කිසි සුළු මුදලක් ලබාගෙන අදාල කාර්යයන් ඉටුකරගැනීම සඳහා අවසර ලබාදෙන ලෙස ඉල්ලීමක් කරන ලදී. එසේම ක්‍රීඩාපිටියට බැරල් බා එකක් ලබාදෙන ලෙස පසුගිය සභාවක ද ඉල්ලීමක් කල බවත්, නමුත් මෙතෙක් එය ලබාදීමට කටයුතු නොකල බවත්, නැවතත් ඒ කෙරෙහි සභාවේ අවධානය යොමු කරන බව ගරු සභාපතිතුමන් විසින්

දැන්විය.( ඉතා ඉක්මණින් එය සකස් කර ලබාදීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමන් විසින් දැන්විය.)

පුවක්ගහමුල්ල ළිඳ ප්‍රදේශවාසීන් විසින් ශුද්ධ පවිත්‍ර කර තිබෙන අතර, එම ළිඳ බැඳීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ( ගල්,වැලි ,සිමෙන්ති) සභාවෙන් ලබාදෙන ලෙස ඉල්ලීමක් කරමින් සිය අදහස් දැක්වීම නිම කරන ලදී. ( අදාල ද්‍රව්‍ය ලබාදීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමන් විසින් දැන්විය.)

15. **අවසානය:**

**ගරු සභාපති,ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා :**

අද දින සභාවේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා සහයෝගය ලබාදුන් ගරු උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන්ටත්, ප්‍රධාන කළමණාකරණ සහකාර මහත්මියටත්, සිය ස්තුතිය ප්‍රකාශ කරමින්, සභාවේ වැඩ කටයුතු පෙ.ව. 11.00 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.